රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 05/2022

මගේ අංකය : EST-6/03/LEA/3125
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2022.03.28

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## 2022 රාමලාන් (රාමසාන්) සමයේ දී විශේෂ නිවාඩු ලබා දීම

මෙවර රාමලාන් (රාමසාන්) සමය 2022 අප්‍රේල් 03 දින ආරම්භ වී 2022 මැයි 02 දින අවසන් වීමට නියමිත බැවින් එම කාලසීමාව තුළ දී මුස්ලිම් නිලධරයන්ට යාඥා සහ ආගමික වතාවත්වල නිරත විය හැකි වන පරිදි වැඩ පිළිවෙළක් සකස් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

02. යාඥා සහ ආගමික කටයුතු දිනපතා සිදු කෙරෙන කාලවේලාවන් පහත දැක්වෙන පරිදි වේ.

* පෙරවරු 03.30 සිට පෙරවරු 06.00 දක්වා
* පස්වරු 03.15 සිට පස්වරු 04.15 දක්වා
* පස්වරු 06.00 සිට පස්වරු 07.00 දක්වා
* පස්වරු 07.30 සිට පස්වරු 10.30 දක්වා

03. හැකි සෑම අවස්ථාවක දී ම එම නිලධරයන්ට ආගමික වතාවත්වල යෙදීමට හැකිවන පරිදි වැඩමුර සකස් කර දිය යුතු ය. නොවැළැක්විය හැකි අවස්ථාවල දී පමණක් විශේෂ නිවාඩු අනුමත කිරීම මැනවි.

04. රාමලාන් (රාමසාන්) අවසන් වීමට දින 14කට කලින් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සුදුසුකම් ඇති මුස්ලිම් නිලධරයන්ට උත්සව අත්තිකාරම් ලබා දීමට ද කරුණාකර කටයුතු කරන්න.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා